01

# අභියෝග ජය ගත් සිදුහත් බෝසතාණෝ

දිවා කල විඩා බර බව දුරලමින් උදා වූ සවස් කාලය සිත් පහන් කරන්නක් විය. ගුවන් විදුලියෙන් ප්‍රචාරය වන්නා වූ අපූරු ගීතයක් මා සවනට වැටිණි. විශාරද වික්ටර් රත්නායකගේ මියුරු හඬින් ගීතවත් වන,

''අමා දහර දිය ගලා ගලා
තුරු ලතා තුළින් මල් පියලි සලා
ජය හඬින් ලොවට සිහ නද පතුරා
ලෝසත අතරින් ජනිත වුණා''

යන ගීතය සවනට වැටෙන විට මසිත ඇදී ගියේ මෙතෙක් ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම ශාස්තෲන් වහන්සේ වන ලොව්තුරා අමා මෑණී බුදුරජාණන් වහන්සේ වෙත ය. බෝසත් උපත මෙන් ම බෝසත් චරිතය ද අභියෝගයන්ගෙන් පිරී පැවති එකකි. බෝසතුන් ජය ගත් අභියෝග අපමණ ය. සුවිශේෂ වූ එම ජයග්‍රහණ අපට ද අගනා මග පෙන්වීමකි.

බෝසත් උපත ලොව සිදු වූ අසිරිමත් සිදුවීමෙකි. ඒ සඳහා දේව ආරාධනාව ලැබූ පසු බෝසත්වරයෙකු විසින් පංච මහා විලෝකනය මඟින් පූර්ව අධ්‍යයනයක් කරනු ලැබේ. දෙවියන් ආරාධනා කළ පමණින් ම බෝසතාණෝ එය නො පිළිගත්හ. තමාගේ අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලීම පංච මහා විලෝකනයයි. සත්‍ය වශයෙන් ම එය ශ්‍රේෂ්ඨ උපත හා බැඳුණු අභියෝගයකි. සිය අරමුණ ඉටුකර ගත හැකි සාර්ථක ජීවිතයක් සඳහා පදනම සකස් කර ගත යුතු ආකාරය පිළිබඳ ව පංච මහා විලෝකනය තුළින් මනා ව පැහැදිලි වේ. ජීවිතයේ වැදගත් තීරණ ගැනීමේ දී සිතා, විමසා බලා කටයුතු කළ යුතු ය. ක්ෂණික තීරණ මත ක්‍රියා කිරීමෙන් ගැටලු ඇති වන අවස්ථා බොහෝ ය. සාර්ථක ශිෂ්‍ය ජීවිතයක් උදෙසා මෙය අපට පූර්වාදර්ශයකි. බෝසත් උපත සිදු වූ විගස පියවර තැබීමත්, බෝසත් සිරිපා පිළිගැනීමට සත් පියුම් පිපීමත්, සිංහ නාද පැවැත්වීමත් වෙනත් කිසිදු උපතක දක්නට නො ලැබුණ ආශ්චර්යවත් සිදුවීම් ය.

රාජකීය පවුලකට අදාළ සැප සම්පත් හා ආරක්ෂාව මැද වැඩුණු සිදුහත් බෝසතාණෝ රජ කුමරකුට අවශ්‍ය ශිල්ප පිළිබඳ විශේෂ පුහුණුවක් ද ලැබූහ. එනම් නීති ශාස්ත්‍රය, කඩු ශිල්පය, දුනු ශිල්පය හා ඇතුන්, අසුන් හැසිරවීම ආදී සියලු ශිල්ප ශාස්ත්‍ර පිළිබඳ පුහුණුවයි. සිදුහත් කුමරා **සර්ව මිත්‍ර** නම් බමුණු පඬිවරයාගෙන් ඉතා කෙටි කලකින් ශිල්ප ශාස්ත්‍ර උගත් බව ද සඳහන් වෙයි. ගුරුවරයා වෙතින් සියලු ශිල්ප ශාස්ත්‍ර කුමරා මැනැවින්,

කඩිනමින් ප්‍රගුණ කළේ ය. කිසි විටකත් ආචාර්යවරයාගේ සිත නොරිදවී ය. එක ම දෙය නැවත නැවත සිහිපත් කිරීමට ගුරුවරයාට අවශ්‍ය නොවී ය. සිදුහත් කුමරුගේ ළමා අවදියේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ වූයේ කීකරු බව, කාරුණික බව, උගන්වන දේ හොඳින් ධාරණය කර ගැනීම, මෙත් සිතුවිලිවලින් යුක්ත වීම හා නිර්භීත බව ය. කිසි විටකත් අන් අය තලා පෙළා නැගී සිටීමේ ආසාවක් නො තිබූ කුමරාණෝ නිහඬ ව සියලු ශිල්ප මැනැවින් හැදෑරීම ගැන ම සිත යොමු කරමින් කටයුතු කළහ. සිය වයසට ගැළපෙන දේ කිරීමත්, තම දෙමාපියන්ට හෝ තමාට හෝ අගෞරව වන කිසිවක් සිදු නොකිරීමත් කුමරුගේ ශිෂ්‍ය ජීවිතයේ සුවිශේෂ ලක්ෂණ ය. ධන බලය, රජ බලය ආදී සියලු සැප සම්පතින් නො අඩුව වැඩුණු කුමරාට එකල කළ නො හැක්කක් නොවී ය. එහෙත් කුමරු ඒවායින් උදම් නොවී සියල්ල විමසුම් නුවණින් යුතු ව සිදු කිරීමෙන් ම පැහැදිලි වනුයේ තරුණ ජීවිතයේ අභියෝග ඉතා සාර්ථක ලෙස ජය ගත් ආකාරයයි.

සොළොස් හැවිරිදි යෞවනයට එළඹි කුමරුන්ට සුදුසු කුමරියක සරණ පාවා දීමට පිය රජතුමාණෝ කටයුතු සූදානම් කළහ. මෙහි දී ඥාති රජවරුන් කුමරුගේ ශිල්ප ඥානය පිළිබඳ ව සැකයක් මතු කළ හෙයින්, ඥාතීන් ඉදිරියේ ශිල්ප දැක්වීමට සිදුහත් කුමරු නිර්භීත ව ඉදිරිපත් විය. එදා බොහෝ ඥාතීන් හමුවේ ධනු ශිල්පය, කඩු ශිල්පය, ඇතුන් හා අසුන් මෙහෙයවීම ආදියෙහි තමා තුළ පැවති සුවිශේෂ නිපුණත්වය කුමරු විදහා පෑවේ ඔවුන් විස්මයට පත් කරවමිනි. ඒ සිදුහත් කුමරුන් ජය ගත් තවත් අභියෝගයකි.

ස්වයංවරයකින් සුදුසු කුල කුමරිය තෝරා ගැනීමේ එදා පැවති සිරිතට අනුව කුමාරයාණෝ සුප්‍රබුද්ධ ශාක්‍ය රජුගේ රූමත් දියණිය වූ භද්දකච්චානා හෙවත් යසෝදරාවන් සමග විවාහ වූහ. යෞවනයෙකු ලෙස විවාහය සඳහා සුදුසු කුල කුමරියක තෝරා ගැනීමේ දී බුද්ධිමත් ලෙස තීරණ ගැනීමත්, දෙපාර්ශ්වයේ ම ආශීර්වාදය මැද විවාහ මංගල්‍යය සිදු කිරීමත් යොවුන් වියේ තරුණයෙකු මුහුණ දෙන අභියෝග වේ. මේ අවස්ථාවේ බෝසත් කුමරු ක්‍රියා කළ අන්දම යෞවනයන්ට ආදර්ශයකි.

සියලු මාපියවරුන්ගේ අභිලාෂය තම පුත්‍රයා ලොව දිනනු දැකීම ය. ඒ හැඟුම සුදොවුන් මහ රජතුමා තුළ ද නො අඩු ව පැවතුණි. තම පුත් කුමරා සක්විති රජ කෙනෙකු වනු දැක්ම පිය රජතුමාගේ එක ම සිහිනය විය. ඊට බාධක වන කිසිවක් කුමරුට හමු නොවන්නට පිය රජතෙමේ කටයුතු සැලසුවේ ය. එතුමා රජ කුමරකු ලෙස සිය පුතුට උසස් කාමභෝගී ජීවිතයක් ගෙවීම සඳහා ගිම්හාන, හේමන්ත, වස්සාන යන සෘතු තුනට අනුරූප වන පරිදි රම්‍ය, සුරම්‍ය, සුභ නමින් සුඛෝපභෝගී මාලිගා තුනක් කරවා දුනි. එම මාලිගා තුළ රූමත් කුමාරිකාවෝ කුමරු පිනවීම සඳහා නැටුම්, ගැයුම්, වැයුම් පැවැත්වූහ. ගිහිගෙය සැපවත් කාමභෝගී ජීවිතයකට සුදුසු ඒකායන මග බව පෙන්වීමට අවැසි පරිසරය පිය රජතුමන් විසින් ගොඩ නංවනු ලැබ තිබුණි. එහෙත් එසේ රජ සැප විඳීම කුමරාගේ අරමුණ නොවී ය. ජීවිතයේ යථාර්ථයත් විමුක්තියත් සොයා යාම කුමරුගේ අරමුණ වූයේ ය. කාමභෝගී බව හා රජ සැප කුමරුට අභියෝගයක් විය.

ඉඳුරන් පිනවමින් අත්‍යෂ්තිකර ව කම්සැප සොයා යන අය අද මෙන් ම එකල ද සුලභ වූහ. එහෙත් ඔවුනට නොපෙනෙන පැත්තක් බෝසතාණන්ට පෙනිණ. මේ සියලු සැප සම්පත්



තාවකාලික බව දුටු කුමරාණෝ සදාකාලික සුවයක් උදා කර ගැනීමේ අභියෝගයට මුහුණ දුන්හ; අනුක්‍රමයෙන් එය ජයගත්හ. තමා කරන සියලු කටයුතු නිවැරදි ව මැනැවින් සිදු කිරීමත් බොහෝ කරුණු සිතා විමසා බලා ක්‍රියාවට නැගීමත් බෝසත් චරිතය පුරාවට ම දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණයකි. බෝසත් උපත සිදුවී සත් දිනකින් මව කළුරිය කළ බව අප දන්නා කරුණකි. සත්‍ය ලෙස ම සැබෑ මවු සෙනෙහස අහිමි වුව ද බෝසතාණෝ ඒ ගැන ම සිතමින් කාලය ගත නො කළහ. ළමා වියෙහිත් තරුණ වියෙහිත් දූර දක්නා නුවණින් යුතු ව කටයුතු කිරීමට කුමරු සමත් විය. මව අහිමි වූ බොහෝ දරුවන් ජීවිතය අසාර්ථක කර ගන්නා ආකාරය අපි දැක ඇත්තෙමු. එහෙත් බෝසත් කුමරුට එය දිනාගත නොහැකි අභියෝගයක් ලෙස නොපෙනුණි.

වයසින් හා නුවණින් මුහුකුරා යත් ම තමා ගත කරන ජීවිතය පූර්ණ තෘප්තියට උපකාරී නොවන බව සිදුහත් බෝසතාණෝ පසක් කළහ. මාලිගාවෙන් පිටත ලෝකයේ යථාර්ථය දැකීමට කුමරුට අවශ්‍ය විය. රජ උයනට යාම ප්‍රිය කළ කුමරුන්ට අතරමග දී සතර පෙරනිමිති දක්නට ලැබුණි. එයින් ප්‍රබල මානසික ගැටලුවක් ඇති විය. සතර පෙරනිමිති ද ඒවා හුදෙක් කායික රූප ලෙස ම නොසලකා ජීවිතයේ යථාර්ථය ප්‍රකාශ කරන කරුණු ලෙස කුමරු පසක් කර ගත්තේ ය. නිසැක ව ම ලොව උපන් සත්ත්වයා වයසට යාම, ලෙඩ වීම හා මිය යාම හෙවත් ජරා, ව්‍යාධි, මරණ යන දුක් පීඩාවන්ට ලක් වන බව කුමරු වටහා ගත්තේ ය. උපන් සියලු සත්ත්වයා මේවාට මුහුණ පාන්නේ නම් මේවායින් මිදීමට මගක් සෙවිය යුතු බව ඡන්න සමග කළ සාකච්ඡාවෙන් කුමරු තේරුම් ගත්තේ ය. සියලු යස ඉසුරු මැද දිවි ගෙවූ තරුණයකු වුව ද විමසිලිමත් බව නිසා ම ජීවිතයේ යථාර්ථය යනු තමා අත්විඳින ජීවිතය නොවන බව කුමරුට අවබෝධ විය. මහලු වීම, ලෙඩ වීම හා මරණය සමස්ත සත්ත්ව ප්‍රජාවට ම සසර මුහුණ දීමට ඇති අනිවාර්ය අභියෝග බව දකිමින් ඒවා ජය ගැනීමට එතැන් පටන් කුමරු කැප වූ බව පෙනේ.

මහල්ලකු, ලෙඩකු හා මළකඳක් දැක ජීවිතයේ ස්වභාවය තේරුම් ගැනීම හා උපශාන්ත පැවිදි රුව දැකීමෙන් සන්සුන් බවට පත් වීම බෝසත් සිරිතේ සුවිශේෂ සිදුවීමකි. නිශ්කාමී සැහැල්ලු පැවිදි ජීවිතයට ඇතුළු වීමෙන් සාංසාරික අභියෝග ජය ගත හැකි බව කුමරුට අවබෝධ වූයේ මෙකී පෙරනිමිති දැකීමෙනි. එම සිතිවිල්ල ම එදින සැහැල්ලුවෙන් ගත කිරීමට හේතු විය.

උපශාන්ත පැවිදි රුව ගැන ම සිත යොමු කරමින් සිටි බෝසතුනට මාලිගයෙන් පැමිණි පණිවුඩකරුවෙකුගෙන් අසන්නට ලැබුණේ යසෝදරා දේවිය පුතකු ලද බවයි. එවිට ම පැවිදි වීමට බාධකයක් ඇති වූ බව සිහි වී **රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං** යනුවෙන් කුමරුගේ මුවින් පිට වූ බව සඳහන් වේ. දරුවකුගෙන් වෙන් වීම පියෙකුට පහසු කාර්යයක් නොවේ. එය මහත් ම වූ ජීවිත බන්ධනයකි. නිශ්කාමී වූ පැවිදි දිවියට පත්වීමට සිතන්නකුට අභියෝගයකි. තම පුතණුවන් වෙනුවෙන් ගිහි ගෙයි රැඳුණහොත් එවන් පුතුන් සුවහසක් සසර දුකෙහි ගිලෙන බව වටහා ගත් කුමරාණෝ දුකින් මිදීමේ මග සොයා යාමේ තිර අදිටනෙහි පිහිටියෝ ය. කුමරු එම අභියෝගයට ද මුහුණ දී ජයගත්තේ ය.



තේජසින් සපිරි, එහෙත් ශාන්ත වූ, ප්‍රියංකර වූ, බෝසතුන්ගේ අනුපමේය රූප ශ්‍රීය, කිසාගෝතමිය නම් ශාක්‍ය කුමරියගේ නිබ්බුත පද තුළින් පැහැදිලි වේ. එහි දී කියවුණු **මෙවන් පුතෙකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති** යන්න බොහෝ පුතුන්ගෙන් දෙමාපියනට නො ලැබෙන ගෞරවයකි. හද්‍ර යෞවනයේ පසුවන තරුණයකු තුළින් බලාපොරොත්තු විය නොහැකි තැන්පත් ස්වභාවයක් කුමරා තුළ ඇති වූයේ ළමා වියෙහි සිට ම ය. සුදුසු වයසට සුදුසු දේ කිරීමත් විමසුම් නුවණත් නිසා ම කුමරුට බොහෝ අභියෝග ජය ගත හැකි විය. එසේ ම **මෙවැනි ස්වාමියෙක් ඇති බිරිය ද නිවීම ලැබ සිටින්නියකි** යන්නෙන් කුමරා යහපත් ස්වාමියෙකු ලෙස සාර්ථක යුග දිවියක් ගෙන ගිය බව පැහැදිලි වේ. කීකරු පුතෙකු ලෙසත්, යහපත් ස්වාමියකු ලෙසත්, සිදුහත් කුමරු ගිහි ජීවිතය ගත කිරීම සුවිශේෂ ලක්ෂණයෙකි. උපශාන්ත පැවිදි රුව දැකීමෙන් පැවිදි වීමට කුමරුගේ සිතෙහි ඇති වූ ඇල්ම ඒ නිසා මඳකුදු වෙනස් නොවී ය. අධිෂ්ඨානය සහ නිවැරැදි අරමුණ කරා ගමන් කිරීමට බාහිර කිසිවක් බාධාවක් කර නොගැනීම බෝසත් සිරිතේ උදාර ලක්ෂණයකි.

ප්‍රාසාදවලින් බිමට නොබැස නළු නිළියන් පිරිවරාගෙන කමින් බොමින් විනෝදකාමී ව ගෙවන ජීවිතයෙහි හරයක් නැති බව වටහා ගත් බෝසතුන් තුළ පැවිදි වීමේ ඇල්ම දැඩි ව ඇති විය. අද මෙන් ම එදා සමාජයේ ද බොහෝ තරුණයන්ට නොලැබුණු යස ඉසුරු ලැබුව ද ඒ සියල්ල අලුයම ලූ කෙළ පිඬක් සේ ඉවත දැමීමට කුමරුගේ අධිෂ්ඨානය ප්‍රබල විය. ඒ නිසා ම එතුමාට බොහෝ අභියෝග ජය ගත හැකි විය.

පිය රජතුමාණන්ගේ එක ම අභිලාෂය වූයේ සිය පුත් කුමරා සක්විති රජකු කිරීම ය. එහෙත් පුත් කුමරාගේ අභිලාෂය වූයේ සියල්ල හැර දමා ගොස් පැවිදි වීම ය. සක්විති රජ ව සැප විඳිනවාට වඩා ලෝ සතුන් දුකින් මුදවා ගැනීම උදෙසා දුක් විඳීම බෝසතුන්ට ප්‍රිය විය. සක්විති රජුට වුව ද සසරෙහි ඉපිද ජාති, ජරා, ව්‍යාධි හා මරණ ආදී දුක් දොම්නස්වලට මුහුණ දීමට සිදු වේ. නිවන් මග සොයා ගත හොත් තමා මෙන් ම පිය රජතුමා, සුළු මව, යසෝදරාව හා පුත් කුමරු ඇතුළු සියලු ලෝ සතුන් සසර දුකින් මුදවා ගත හැකි බව සිදුහත් කුමරා තේරුම් ගෙන සිටි බව පෙනේ.


හද්‍ර යෞවනයේ පසුවන්නකුට පස්කම් සැපය අත් හැරීම පහසු කටයුත්තක් නොවේ. සක්විති රජකම ද යසෝදරාව ද පුත් කුමරු ද බොහෝ සැප සම්පත් ද අත් හැරීම කුමරුට මුහුණ දීමට සිදුවූ විශාල අභියෝග විය. එහෙත් තමා ද දුකින් මිදී ලෝකයා ද එයින් මුදා ගැනීමේ අධිෂ්ඨානය බලවත් වූ බැවින් කුමරාණෝ ඒ සියලු අභියෝගයන් ජය ගෙන මහා අභිනිෂ්ක්‍රමණය කළහ; පැවිද්දෙකු වී සත්‍යය සොයා ගියහ. සය වසරක දුෂ්කර ජීවිතය ද, ගුරු ඇසුර ද ඔස්සේ විවිධ අභියෝග ජය ගනිමින් තමාගේ ම පාරමී ශක්තිය මත සියලු කෙලෙස් නැති කොට, ලොව්තුරා බුදු බවට පත් වීමට කුමරාණෝ සමත් වූහ.

බෝසත් සිරිත සැබෑ ලෙස ම අභියෝග රැසකින් පිරී පැවතුණකි. ඒ සියල්ල කුමරු ජය ගනු ලැබුවේ ඉවසීම, කැපවීම හා අධිෂ්ඨානය මුල් කොට ගෙන ය. දම් අමා වැස්සෙන් ලෝ සතුන් නිවා සැනසිය හැකි වූයේ ද සංසාරයෙන් එතෙර වීම යන අරමුණ ඉටු කර ගත හැකි වූයේ ද විමසුම් නුවණින් කටයුතු කිරීමෙනි. අපට ශිෂ්‍ය ජීවිතයේ අභියෝග ජය ගැනීමට බෝසත් සිරිත චරිතායනය කළ හැකි ය; ආදර්ශයට ගත හැකි ය. එමඟින් අපට බෝසත් දරුවන් ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය මානසික පරිසරය ගොඩනැගෙන බව අවංක ව ම පිළිගත හැකි ය.

## සාරාංශය

උපත, ශිල්ප හැදෑරීම, පෙරනිමිති දැකීම, නිබ්බුත පද ඇසීම, පස්කම් සුව අත් හැරීම, පිය රජුගේ අපේක්ෂාවන් ඉටු කිරීම ආදි විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදුහත් බෝසතුන්ට සිදු විය. කැපවීම, අධිෂ්ඨානය හා නිවැරැදි ගමන් මග ද ඔස්සේ එම අභියෝග ජය ගැනීමට එතුමාණෝ සමත් වූහ. එය අප සැමට ආදර්ශයකි.

## ක්‍රියාකාරකම




01 ''සිදුහත් බෝසතුන් අභියෝග ජය ගත් සැටි'' යන මැයෙන් පාසල් බිත්ති පුවත් පතට සුදුසු ලිපියක් සකස් කරන්න.

02 සිදුහත් බෝසත් චරිතය ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| අභියෝගය | ආදර්ශය |
|---|---|
| | |

## පුහුණුවට



ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ
ධුනාථ මච්චුනෝ සේනං - නළාගාරංව කුඤ්ජරෝ
(අරුණවතී සූත්‍රය)

අරඹව් නික්මෙව් යෙදෙව් බුදු සසුන්හි,
දිනව් මරසෙන් පරදා බට කැලයට වැදි ඇතෙකු සේ.